# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2446/44 - 2025 ජූලි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2025.07.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BD/LG/LND/2/9/2.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/8/2016/PC/407.

බ/කලෙලෙමගල් දෙමළ විද්‍යාලයට අවශ්‍ය ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රේන්දපොළ 94J ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ යපම්ම උඩගම (අ.ග.පි. 542) ගමේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 710193 හි කලාප අංක 03 හි පත්‍ර අංක 1 හි කැබලි අංක 1 හි දැක්වෙන ඉඩමේ මායිම් පහත පරිදි වේ.

01. **කැබලි අංකය 01**
**ඉඩමේ නම: හොප්ටන් වතුයාය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.8094 ක් පමණ.**

*උතුරට* : අ.ග.පි. 542 හි කැබලි අංක 1006, 1033 සහ 421; *නැගෙනහිරට* : අ.ග.පි. 542 හි කැබලි අංක 421 හා 420 (කොටසක්); *දකුණට* : අ.ග.පි. 542 හි කැබලි අංක 420 (කොටසක්); *බටහිරට* : අ.ග.පි. 542 හි කැබලි අංක 420 (කොටසක්) සහ 1006.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 සැප්තැම්බර් මස 22 වැනි දින පෙ.ව. 09.00 ට ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 සැප්තැම්බර් මස 08 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**එස්. පුවනේන්ද්‍රන්,**
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2025 ජූලි මස 21 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0294



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම් යොමු අංකය* : DSM/WL/LND/4/3/8/8/27.
*කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය* : 03J/91/IR/176.

උක්ත ශීර්ෂය යටතේ අංක 2436/13 හා 2025.05.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමෙ හි හිමිකම් පරීක්ෂණ දිනය 2025.06.04 ලෙස සඳහන් වුව ද, අදාළ පරීක්ෂණය එදිනට පැවැත්වීමට නොහැකි වූ බැවින් හිමිකම් පරීක්ෂණ දිනය 2025.10.08 ලෙස සංශෝධනය කරමි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 08 වැනි දින පෙ.ව. 10.00 ට විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 සැප්තැම්බර් මස 30 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**එච්. එම්. අයි. සිරිවර්ධන,**
ප්‍රාදේශීය ලේකම්,
විල්ගමුව.

විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0296

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.